*සැ. යු.—* 2006.04.28 වැනි දින පළකරන ලද අංක 1,443 දරන *ගැසට් පත්‍රයෙහි* II කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,444- 2006 මැයි 05 වැනි සිකුරාදා - 2006.05.05**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන ... .. | 341 |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — | මිළ පාලන දැන්වීම් .. ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | 340 | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් .. ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — | ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන .. ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා .. ... | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | 340 | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් .. ... | 341 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — | සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් .. ... | — |


*සැ. යු.—*(i) ලංකා විදුලිබල මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත 2006 අප්‍රේල් මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) විදුලිබල ප්‍රතිසංස්කරණ (සංශෝධන) පනත් කෙටුම්පත 2006 අප්‍රේල් මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2006 මැයි මස 11 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 අප්‍රේල් මස 28 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2006 අංක 88

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :—

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I වන පන්තියේ, බී. එම්. එස්. සමරසේකර මහතා 2005 නොවැම්බර් මස 18 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්

05-82

---

2006 අංක 89

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :—

ආචාර්ය එච්. එල්. ඔබේසේකර මහතා 2005 දෙසැම්බර් මස 19 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්

05-81

2006 අංක 90

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :—

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ, එස්. හපුආරච්චි මහතා 2006 ජනවාරි මස 23 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු කළුතර පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/ දිසාපති වශයෙන්

05-83/1

---

2006 අංක 91

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :—

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ, එස්. එම්. ජී. ජයරත්න මහතා 2006 ජනවාරි මස 23 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/ දිසාපති වශයෙන්

05-83/2

# වෙනත් පත්කිරීම් ආදිය

2006 අංක 92

1978 අංක 02 දරන අධිකරණ සංවිධාන පනතේ 45 (3) වැනි වගන්තියෙන් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව අධිකරණ සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය අමරසිරි දොඩංගොඩ වන මම පහත උපලේඛනයේ සඳහන් නීතිඥ මහත්ම/මහත්මීන් අදාල අධිකරණ කොට්ඨාස සඳහා සාමදාන විනිශ්චයකාරවරුන් සහ නිල නොලත් මහෙස්ත්‍රාත්වරුන් වශයෙන් පත් කරමි.

අමරසිරි දොඩංගොඩ,
අධිකරණ සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2006 අප්‍රේල් මස 04 වැනි දින,
අධිකරණ සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
කොළඹ 12.

උපලේඛනය

| | *නම* | *ලිපිනය* | *අධිකරණ බල ප්‍රදේශය* |
|---|---|---|---|
| 01. | නීතිඥ බී. ටී. ජයලක්ෂ්මි ජයසූරිය උළුවිටිය මිය | අංක 123, බටුවන්තුඩාව පාර, උළුවිටිකේ | ගාල්ල |
| 02. | නීතිඥ හාල්පන්දෙනිය හේවගේ මුණිදාස මහතා | "සොමිසෙවන", බටුවන්හේන, ඇල්පිටිය | ඇල්පිටිය |
| 03. | නීතිඥ යමුනා පුෂ්පකාන්ති මහගමගේ මිය | "සිරිසෙවන", මහමාවත, කැකණදුර | මාතර |
| 04. | නීතිඥ ඉන්දිකා සුරනී නාගරත්න කොත්තගොඩ මිය | අංක 76/1, ධර්මාරාම මාවත, කොටුව, මාතර | මාතර |
| 05. | නීතිඥ ලලිත් හේම කරුණාරත්න මයා | අංක 214/26, බොරල පාර, වැලිගම | මාතර |
| 06. | නීතිඥ එන්. පී. සෙනෙවිරත්න මහතා | අධිකරණ මාවත, කෑගල්ල | කෑගල්ල |
| 07. | නීතිඥ අබ්දුල් කාදර් අබ්දුස්සලාම් මහතා | වැල්පොතුවැව, බොරළුවැව | කුලියාපිටිය |
| 08 | .නීතිඥ ඩබ්ලිව්. ඒ. දමයන්ති ප්‍රියංචදා පද්මකුමාර ඉඹුල්ගොඩ මිය | අංක 12, වදාකඩ පාර, කහවත්ත ඇල, පොල්ගහවෙල | කුරුණෑගල |
| 09. | නීතිඥ දෝන හයසින්ත් ස්විනීතා මල්ලවාරච්චි මිය | අංක 220, වැලිකන්න, වග | අවිස්සාවේල්ල |
| 10. | නීතිඥ සජීව ප්‍රදීප් කුමාර රත්නායක මහතා | අංක 107, අභය පෙදෙස, නවනගරය, අනුරාධපුරය | අනුරාධපුරය |

05-28

# ආණ්ඩුවේ නිවේදන

## වන්දනා ආඥාපනත

ගොඩපිටිය මුස්ලිම් උත්සවය - 2006

මාතර දිස්ත්‍රික්කයේ අතුරලිය ප්‍රාදේශී ලේකම් කොට්ඨාසයේ ගොඩපිටිය පෝරුවේ (අකුරැස්ස-ගොඩපිටිය) "මොහියදීන් මුස්ලිම් දේවස්ථානයේ" වාර්ෂික ආගමික උත්සවය 2006 මැයි 10 දින ආරම්භ වී 2006 මැයි 21 වැනි දින අවසන් කරන බව (175 අධිකාරය) වන්දනා ආඥාපනත යටතේ සකස් කර 1954 ජනවාරි මස 08 දින අංක 10630 දරන *ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රෙගුලාසිවල 3 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

1954 ජනවාරි මස 08 දින අංක 10630 දරන *ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රෙගුලාසි ඉහත පැවැත්වෙන කාලය තුළදී එකී රෙගුලාසි වල සඳහන් එහිම උප ඡේදයෙන් විස්තර වන "කඳවුර තුළ" ක්‍රියාත්මක වේ.

කී. රණවීර,
ප්‍රාදේශීය ලේකම්,
අතුරලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2006අප්‍රේල් මස 18 වැනි දින,
අතුරලිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

05-79

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2006.02.09 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. කේ. කේ. පී. රේණුකා ද සිල්වා මහත්මිය විසින් සහතික කරන ලද 2004.05.28 වැනි දිනැති අංක 369 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2005.11.30 දින තෙක් ණය රුපියල් තිස්ලක්ෂයක් (රු. 30,00,000) මත පිටහිටි පොලිය වශයෙන් රුපියල් තිස්දෙලක්ෂ අසූදහස් නවසිය හැත්තෑතුනයි ශත අනූදෙකක (රු. 32,80,973.92) මුදලක් සමඟ රුපියල් විසිනවලක්ෂ දහඅට දහස් විස්සයි ශත දහඅටක (රු. 29,18,020.18) මුදලක් මත වසරකට සියයට පහළොවයි දශම පහ (15.5%) බැගින් පොලියක්, 2005.12.01 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් ආරච්චිගේ සුනෙත් මාලිංග ලොකුහේවා මහතා සහ ආරච්චිගේ ඉෂාන් කණිෂ්ක ලොකුහේවා මහතා යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 369 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් තිස්දෙලක්ෂ අසූදහස් නවසිය හැත්තෑ තුනයි ශත අනූදෙකක (රු. 32,80,973.92) මුදල සමඟ 2005.12.01 වැනි දින සිට රුපියල් තිස්ලක්ෂයක (රු. 30,00,000) ණය මත විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද, අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට ගම්පහ, උසාවිය පාර, සණස චතුරශ්‍රය, අංක 12හි පදිංචි වෙන්දේසිකාර ටී. එම්. එස්. පීරිස් මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු (අයකර ගැනීම් ශාඛාව)ට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### පළමුවන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලයේ, දාසිය පත්තුවේ, කටුනායක-සීදුව නගර සභා සීමාවේ ලියනගේමුල්ල ග්‍රාමයේ පිහිටි මුනිදාස කුමාරතුංග මාවත, වරිපනම් අංක 477/106 දරන "බාබාගුරුවත්ත" ඉඩම නමැති බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර විසින් සාදන ලද 1982 නොවැම්බර් මස 09 දිනැති වඩා නිවැරදි 1981 දෙසැම්බර් මස 18 දිනැති අංක 2382 දරන පිඹුරේ විස්තර කළ ලොට් 33 වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : ලොට් B ද, නැගෙනහිරට : ලොට් 34 ද, දකුණට : ලොට් 32 ද, බස්නාහිරට : ලොට් 1 ද මායිම්ව එකී අංක 2382 දරන පිඹුර අනුව පර්චස් දහයයි දශම දෙකයි පහක (අ. 0, රූ. 0, පර්. 10.25) බිම් ප්‍රමාණය සමඟ එහි පිහිටි සියලු දේ වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 694/115හි ලියාපදිංචි කර ඇත.

### දෙවන උපලේඛනය

එකී පරිදි ලියනගේමුල්ල ග්‍රාමයේ පිහිටියාවූ ද, "බාබාගුරුවත්ත" නමැති ඉඩම එකී අංක 2382 දරන පිඹුරේ විස්තර කළ ලොට් ඒ (පාරක් සඳහා වෙන්කළ) වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : ලොට් 2 සහ 3 ද, නැගෙනහිරට : ලොට් 44 සහ 46 ද, දකුණට : වෙලබොඩ පාර ද, බස්නාහිරට : ජේ. ඊ. පී. රාජපක්ෂ සහ අනෙක් අයගේ උරුමක්කරුවන් හිමිකම් කියන ඉඩම ද, ලොට් 47 ද, ලොට් H සහ ලොට් 40 සිට 43 සහ ලොට් B ද, මායිම්ව එකී අංක 2382 දරන පිඹුර අනුව රූඩ් එකයි පර්චස් බිංදුවයි හතරක (අ. 0, රූ. 1, පර්. 04) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 735/288හි ලියාපදිංචි කර ඇත.

එකී පරිදි ලියනගේමුල්ල ග්‍රාමයේ පිහිටි "බාබාගුරුවත්ත" නමැති ඉඩම එකී අංක 2382 දරන පිඹුරේ විස්තර කළ ලොට් බී (පාර සඳහා වෙන්කළ) වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : ලොට් 3 සිට ලොට් 15 ද, නැගෙනහිරට : ලොට් A ද, දකුණට : ලොට් 43, 38, 37, 34, 33, 26, 25, 22, 21 සහ ලොට් ඩී හා ලොට් 1 ද, බස්නාහිරට : ලොට් 16 සහ ලොට් සී ද මායිම්ව එකී අංක 2382 දරන පිඹුර අනුව රූඩ් එකයි පර්චස් පහයි දශම පහක (අ. 0, රූ. 1, පර්. 5.5) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 646/294හි ලියාපදිංචි කර ඇත.

එකී පරිදි ලියනගේමුල්ල ග්‍රාමයේ පිහිටි "බාබාගුරුවත්ත" නමැති ඉඩම එකී අංක 2382 දරන පිඹුරේ විස්තර කළ ලොට් 1 (පාර සඳහා වෙන් කළ) වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : ලොට් B ද, නැගෙනහිරට : ලොට් 30 සිට 33 ද, දකුණට : ලොට් H ද, බස්නාහිරට : ලොට් 26 සිට 29 ද, මායිම්ව එකී අංක 2382 දරන පිඹුර අනුව පර්චස් එකොළහක (අ. 0, රූ. 0, පර්. 11) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 658/256හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. ඒ. ජී. කරුණාරත්න,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු,
(අයකරගැනීම්-ශාඛා).

ලංකා බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක 04, ලංකා බැංකුව මාවත,
කොළඹ 01

05-51

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 6/39569/එල්6/748.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2003.12.12 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ඩී. මලගොඩ විසින් සහතික කරන ලද, 2000.05.10 දින හා අංක 1484 දරන උකස් බැඳුම්කරය මත අය වියයුතු මුදල් ගෙවීම, හෝමාගම පදිංචි මැද්දගේ දොන් ජයරත්න කපුමුල්ල යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2003.11.13 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් තිස් හතර දහස් හාරසිය දෙකයි ශත විසිහත (රු. 34,402.27)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 1484 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් දහතුනයි ශත හතලිස් හතරක (රු. 13.44) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, පානදුර, ඩයස් ගොඩනැගිල්ලේ හි බලයලත් වෙන්දේසිකාර එච්. ගිල්ටන් පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේය.

#### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර උතුරු තොටමුණේ පයාගල බැද්ද පයාගල මග්ගොන්බැද්ද උප කාර්යාලය බේරුවල ප්‍රාදේශීය සභා සීමාවේ දූවේගොඩ පිහිටි සුදුගහලන්ද නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් මැන සකසන ලද 1999.03.05 සහ පෙබරවාරි මස 25, 26, 27 දිනැති අංක 2526 දරන මිනුම් පිඹුරේ කැබලි අංක 82 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, ප. 10. ක්වූ බෙදා වෙන් කරන කල බිම් කොටස වේ.

තවද, එකී මිනුම් පිඹුරේ ආර් 1, ආර්. 2, ආර්. 3, ආර්. 4, ආර්.5, ආර්. 6, ආර්. 7, ආර් 8 ස හ ආර්.9 මතින් ඇති මාර්ග අයිතිය ද සමඟ වේ.

එකී කැබලි අංක 82 සහ මාර්ග ප්‍රවේශය බලයලත් මිනින්දෝරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් සකසන ලද 1999.02.24 දිනැති හා අංක 2522 දරන පිඹුරේ කැබලි අංක ඒ හි උප බෙදුමකි.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 අප්‍රේල් මස 21 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

05-73/7

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 18/58266/වයි18/125.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2006.01.31 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. කුලියාපිටිය ප්‍රසිද්ධ නොතාරිස් වී. බී. සී. එදිරිසිංහ විසින් සහතික කරන ලද,1996.03.12 දින හා අංක 9369 දරන උකස් බැඳුම්කරය මත අය වියයුතු මුදල් ගෙවීම, දුම්මලසූරිය පදිංචි මිහිඳුකුලසූරිය පීටර් වයලට් චන්ද්‍රානි ප්‍රනාන්දු යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2005.12.31 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් පනස් පන්දහස් අසූ හතරයි ශත පහ (රු. 55,084.05)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 9369 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් දහනවයයි ශත තිස් එක (රු. 19.31)ක් බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කුරුණෑගල, මල්කඩුවාව, වටරවුම් පාර, ගම්මඩුගොල්ල මාවත, අංක 15හි බලයලත් වෙන්දේසිකාර බී. එම්. ඒ. විජයතිලක මහතාට බලය පැවරිය යුතු වන්නේය.

#### උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, බිංගිරිය ප්‍රාදේශීය සභා සීමාවේ පළුගමුව ග්‍රාමයේ පිහිටි කට්ටිමහන එස්ටේට් නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ජේ. ගෝමස් විසින් සකසන ලද 1990.12.17 දින හා 142 දරන පිඹුරේ කැබලි අංක 2 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 3, පර්. 34.5ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

තවද, බලයලත් මිනින්දෝරු එච්. එල්. කෲස් දාබරේරා විසින් සාදන ලද අංක 4549/1986 දරන පිඹුරේ කැබලි අංක ඊ මතින් ඇති මාර්ග අයිතිය ද සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 අප්‍රේල් මස 21 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

05-73/6

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 6/43590/එච්6/677.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.01.31 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. මතුගම ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. ෆැස්කුවල් විසින් සහතික කරන ලද, 2002.02.02 දින හා අංක 2580 දරන උකස් බැඳුම්කරය මත අය වියයුතු මුදල් ගෙවීම, වලගෙදර පදිංචි සන්දදූර කොල්වින් සිල්වා *හෙවත්* සන්දදූර කොලින් සිල්වා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2005.12.31 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් එක්ලක්ෂ දොලොස් දහස් අසූහතරයි ශත අනූනවය (රු. 1,12,084.99) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 2580 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් හතලිස් දෙකයි ශත අසූහත (රු. 42.87)ක් බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, පානදුර, ඩයස් ගොඩනැගිල්ලහි බලයලත් වෙන්දේසිකාර එච්.ගිල්ටන් පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේය.

#### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, කුරුදිප්පිට පිහිටි මිල්ලගහලන්ද හි කැබලි අංක 2 නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු පී. ඩබ්. එස්. සී. විතාන විසින් සකසන ලද 1995.09.08 දිනැති හා අංක 612 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 24 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 10 ක් වූ බෙදා වෙන්කල බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමහ වේ.

තවද, එකී මිණුම් පිඹුරේ කැබලි අංක 1 මතින් ඇති මාර්ග අයිතිය ද සමහ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 අප්‍රේල් මස 21 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

05-73/5

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 6/39684/එල්6/580.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.01.31 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. කළුතර ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඊ. එෆ්. කුරේ සහතික කරන ලද, 2000.03.11 දින හා අංක 6999 දරන උකස් බැඳුම්කරය මත අය වියයුතු මුදල් ගෙවීම, බලපිටිය පදිංචි අබ්දුල් බකීර් ෆාතිමා ඉෂානා හා මොහමඩ් ජවුසක් මොහමඩ් රිකාන් *හෙවත්* මොහමඩ් ජවුසක් මොහමඩ් රිකාන් යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2005.12.31 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හාරලක්ෂ අසූ හයදහස් එකසිය හතලිහයි ශත පනහ (රු. 4,86,140.50) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 6999 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය හැටහයයි ශත හැටහයක (රු. 166.66) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, පානදුර, ඩයස් ගොඩනැගිල්ලේ හි බලයලත් වෙන්දේසිකාර එච්.ගිල්ටන් පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේය.

#### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර දකුණු තොටමුනේ බේරුවල බැද්දේ බේරුවල නගර සභා සීමාව තුළ මහගොඩ පිහිටි අලයිනතෝට්ටම් නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඩී. එල්. විජේනායක විසින් මැන සාදන ලද 1997 නොවැම්බර් මස 3 සහ 14 වැනි දින හා 1998.02.17 වැනි දින හා අංක 890 දරන බෙදුම් පිඹුරේ කැබලි අංක 4 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 11ක් වූ බෙදා වෙන්කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමහ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 අප්‍රේල් මස 21 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

05-73/4

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 18/73269/ඩබ්18/018.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.01.31 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. කුලියාපිටිය ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. එල්. එම්. හේරත් විසින් සහතික කරන ලද,2002.08.28 දින හා අංක 404 දරන උකස් බැඳුම්කරය මත අය වියයුතු මුදල් ගෙවීම, කුලියාපිටිය පදිංචි ගල්වත්ත ආරච්චිලාගේ පියදාස හා ගල්වත්ත ආරච්චිලාගේ නිර්ෂාන් ප්‍රදීප් කුමාර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2005.12.31 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හැත්තෑ දහස් එකසිය හැට අටයි ශත අසූනවය (රු. 70,168.89) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 404 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් විසි තුනයි ශතවිසි අටක් (රු. 23.28) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කුරුණෑගල, මල්කඩුවාව, වටරවුම් පාර, ගම්මඩුගොල්ල මාවත, අංක 15හි බලයලත් වෙන්දේසිකාර බී. එම්. ඒ. විජයතිලක මහතාට බලය පැවරිය යුතු වන්නේය.

#### උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුලියාපිටිය ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ ඇඹව පිහිටි වැලිඅගාරවත්ත නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එස්. එම්. දිසානායක විසින් සකසන ලද 2001.09.19 දින හා අංක 2836 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 1, පර්. 15 ක් වූ බෙදා වෙන්කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 අප්‍රේල් මස 21 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

05-73/3

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 2/55411/එෆ්2/841.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.01.31 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. ගම්පහ සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. ඒ. එන්. ඩබ්. රාජකරුණා සහ එස්. සමරසිංහ විසින් සහතික කරන ලද, 1994.10.03 සහ 2000.06.23 දින හා අංක 11011 දරන උකස් බැඳුම්කරය මත සහ ද්විපාර්ශවික ගිවිසුම් අංක 3745 මත අය වියයුතු මුදල් ගෙවීම, කොළඹ 8 පදංචි සමරවීර මුදලිගේ චාර්ලට් සමරවීර *හෙවත්* චාර්ලට් ප්‍රසන්තා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2005.12.31 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හාරලක්ෂ හැත්තෑ එක්දහස් නවසිය විස්සයි ශත පනස්හයක (රු. 4,71,920.56) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 11011 සහ ද්විපාර්ශවික ගිවිසුම් අංක 3745 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය තිස්හතයි ශත දාහත (රු. 137.17)ක් බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, ගම්පහ, උසාවිය පාර, සණස චතුරශ්‍රය, අංක 15හි බලයලත් වෙන්දේසිකාර ටී. එම්. එස්. පීරිස් මහතාට බලය පැවරිය යුතු වන්නේය.

#### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, ආඩිඅම්බලම පිහිටි නුගගහවත්ත, බුළුගහවත්ත සහ කැටකැලගහවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. ඒ. චන්ද්‍රරත්න විසින් සකසන ලද අංක 3656 සහ 1989.04.01 දින දරන මිණුම් පිඹුරේ කැබලි අංක ඒ 41 සහ ඒ 42 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් පිළිවෙලින් අ. 0, රූ. 0, පර්. 10.3ක් හා අ. 0, රූ. 0, පර්. 12.2 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

තවද, එකී අංක 3656 දරන පිඹුරේ කැබලි අංක ඒ 30 මතින් ඇති මාර්ග අයිතිය ද සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 අප්‍රේල් මස 21 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

05-73/2

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 1/36592/සීඩී5/200.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2002.06.27 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. මොරටුව ප්‍රසිද්ධ නොතාරිස් එන්. ජේ. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද, 1999.05.07 දින හා අංක 3829 දරන උකස් බැඳුම්කරය මත අය වියයුතු මුදල් ගෙවීම, මොරටුව පදිංචි කළුතර වෙදගේ පියල් අජිත් ෆොන්සේකා *හෙවත්* කළුතර වෙදගේ ප්‍රියාල් අජිත් ෆොන්සේකා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2002.04.30 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් දෙලක්ෂ හැට හත්දහස් නවසිය විස්සයි ශත තිස්හත (රු. 2,67,920.37)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 3829 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් අනූඅටයි ශත හැටතුනක (රු. 98.63) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, පන්නිපිටිය, හයිලෙවල් පාර, අංක 145 හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක මහතාට බලය පැවරිය යුතු වන්නේය.

### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, මොරටුව මහ නගර සභා සීමාවේ මොරටුමුල්ල පිහිටි පේදුරු පටුමග වරිපනම් අංක 47 හි වඩුගවත්ත ළිඳමුලගෙවත්ත, බෝදියවත්ත, තන්තුලාගෙවත්ත සහ දොඹගහවත්ත නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩබ්. ඩබ්. ඒ. පී. මෙන්ඩිස් විසින් සකසන ලද 1991.09.14 දිනැති සහ අංක 453 බී දරන පිඹුරේ කැබලි අංක 3 බී 1 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 8.13 ක් වූ බෙදා වෙන් කල බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

තවද එකී පිඹුරේ කැබලි අංක 5ඒ මතින් ඇති මාර්ග අයිතිය ද සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 අප්‍රේල් මස 21 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

05-73/10

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 1/30641/සීඩී2/023, 46383/සීඩී8/423.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.02.20 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන ජේ. ඩී. සිරිවර්ධන සහ සී. ද. සිල්වා සහ සී. වී. එල්. සෙනෙවිරත්න විසින් සහතික කරන ලද, 1997.04.27, 1997.06.26 සහ 2004.03.15 දින හා අංක 213 අතිරේක ගිවිසුම් අංක 1017 හා 5791 දරන උකස් බැඳුම්කර මත අය වියයුතු මුදල් ගෙවීම, දෙහිවල පදිංචි ලොකුගමගේ රන්ජිත් ජයසිරි *හෙවත්* ලොකුගමගේ රංජිත් ගාමිණී ජයසිරි යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.01.22 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හත්ලක්ෂ එක් දහස් හත්සිය දහනවයයි ශත තිහක (රු. 7,01,719.30) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 213, අතිරේක ගිවිසුම් අංක 1017 හා 5791 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් දෙසිය පනස් නවයයි ශත හැටඑකක (රු. 259.61) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කැස්බෑව, වලව්වත්තේ, ධම්මිකා, අංක 228/ඒ හි බලයලත් වෙන්දේසිකාර ඒ. එස්. ලියනගේ මහතාට බලය පැවරිය යුතු වන්නේය.

### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල ගල්කිස්ස නගර සභා සීමාව තුළ කරගම්පිටිය ඩී. බී. ජයතිලක මාවතේ වරිපනම් අංක 101, 101ඒ, 105 හා 105ඒ දරන තැබැරුමේවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඩී. ජී. වීරසිංහ විසින් සකසන ද 1994.06.30 දින සහ අංක 553 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 7.96 ක්වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 අප්‍රේල් මස 21 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

05-73/9

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 10/66928/ඩී10/545.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2004.04.08 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. හම්බන්තොට ප්‍රසිද්ධ නොතාරිස්වන ටී. එම්. ෆාරුක් විසින් සහතික කරන ලද, 1999.08.13 දින හා අංක 2019 දරන උකස් බැඳුම්කරය මත අය වියයුතු මුදල් ගෙවීම, හම්බන්තොට පදිංචි කලුදුරගේ සච්දියස් හෙවත් ධනපාල විජේනායක සහ මුදුගමුවේ හේවගේ මිසිනෝනා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2004.02.29 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් තුන්ලක්ෂ හැත්තෑඅටදහස් අටසිය දෙකයි ශත හතලිස් දෙකක (රු. 3,78,802.42) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 2019 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය හැටනවයයි ශත දහය (රු. 169.10) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, ගම්පහ, උසාවිය පාර, සණස චතුරශ්‍රයේ, අංක 15හි බලයලත් වෙන්දේසිකාර ටී.එම්.එස්. පීරිස් මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

#### උපලේඛනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට ප්‍රාදේශීය සභා සීමාව තුළ මිරිජ්ජවිල පිහිටි බලයලත් මිනින්දෝරු ඊ. එම්. ප්‍රේමසිරි විසින් සකසන ලද 1998.04.30 දිනැති හා අංක 980407 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 1 සහ 2 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 1, රූ. 0, ප. 2 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස හා ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 අප්‍රේල් මස 21 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

05-73/8

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 2/61108/කිච්2/297.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.11.03 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. කඩවත ප්‍රසිද්ධ නොතාරිස්වන ඊ. ඒ. හේමචන්ද්‍ර විසින් සහතික කරන ලද, 1997.05.26 දින හා අංක 2360 දරන උකස් බැඳුම්කරය මත අය වියයුතු මුදල් ගෙවීම, වැබොඩ පදිංචි රත්නසේකරගේ අබේතිලක යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2005.09.30 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හාරලක්ෂ තිස්තුන්දහස් තුන්සිය අනූපහයි ශත දහයක (රු. 4,33,395.10) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 2360 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය හැත්තෑ හයයි ශත පනහක් (රු. 176.50) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, නුගේගොඩ පාගොඩ පාර, අංක 3හි බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

#### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, මහර ප්‍රාදේශීය සභා සීමාව තුළ වැබොඩ පිහිටි ගලෙන්හේන නමැති ඉඩමට 1990.12.22 දින සහ අංක 11538 දරන වී. එෆ්. ජේ. පෙරේරා බලයලත් මිනින්දෝරු විසින් මැන සාදන ලද අංක 11538 දරන මිණුම් පිඹුරේ ප්‍රකාර බෙදා වෙන් කරන ලද ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, ප. 46.83 කින් යුත් කැබලි අංක එෆ් 1 දරන බිම් කොටස සහ ඊට අයිති සියලු දේත් සමඟ වේ.

තවද එකී අංක 11538 දරන පිඹුරේ සඳහන් කැබලි අංක එෆ්ජ් 2 මතින් ඇති මාර්ග අයිතිය ද සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 අප්‍රේල් මස 21 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

05-73/1

## මහජන බැංකුව-කිරිබත්ගොඩ ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඞී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2003.04.30 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. ඒකනායක විසින් සහතික කරන ලද 1997.12.26 දිනැති අංක 548 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, පතිරණ බණ්ඩාරගේ නන්දසේන යන අය විසින් පැහැර ඇති බැවින්ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් තුන්ලක්ෂ අනූදෙදහස (රු. 3,92,000)) සහ රුපියල් හයලක්ෂ හැත්තෑදෙදහස (රු. 6,72,000) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින්ද, 1998.01.23 දින සිට වර්ෂයකට 28% බැගින් රුපියල් තුන්ලක්ෂ අනූදෙදහස් (රු. 3,92,000) සහ 1998.01.23 දින සිට වර්ෂයකට 28% බැගින් රුපියල් හයලක්ෂ හැත්තෑදෙදහස (රු. 6,72,000) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා වෙන්දේසි ගාස්තුද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් තුන්ලක්ෂ අනූදෙදහස් (රු. 3,92,000) සහ රුපියල් හයලක්ෂ හැත්තෑදෙදහස (රු. 6,72,000) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඩන්ස්ටන් කෙලාට් විසින් එකී අංක. 548 දරන උකස්කරය යටතේ  එකී බැංකුවට උකස් කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපල පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, තල්වත්තේ පිහිටි කෝන්ගහවත්ත නැමැති ඉඩමේ අංක 1 දරන කොටසට එම්. ඩබ්. ඩී. එස්. ද සිල්වා අවසරලත් මානක තැනගේ අංක 2766/ඒ සහ 1995.02.10 දින දරන පිඹුර අනුව මායිම් : උතුරට : නැසීගිය එස්. ඩී. තෙලේනිස් ජයසිංහගේ උරුමක්කාරයින්ට අයත් ඉඩම සහ පාරද, නැගෙනහිරට : නැසී ගිය ජොහානිස් අප්පුහාමිගේ උරුමක්කාරයින්ට අයත් ඉඩමද, දකුණට : කිරිදිවැල කුඹුරේ ඉතිරි කොටස ද, බස්නාහිරට : නැසීගිය එස්. ඩී. තෙලේනිස් ජයසිංහගේ උරුමකාරයින්ට අයත් ඉඩම ද යන මායිම් තුළ පිහිටි රූඩ් තුන (අ. 0, රූ. 3, පර්.) ක විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක සී560/60 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර.

මහජන බැංකුව,
බටහිර III කලාප කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

05-30

## මහජන බැංකුව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.09.20 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහජන බැංකුව සඳහා මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. කේ. විජේරත්න විසින් සහතික කරන ලද 2003.12.30 දිනැති අංක 4041 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම 1938 අංක 51 දැනට 1982 අංක 17 දරන සමාගම් ආඥා පනත යටතේ නිසි පරිදි සංස්ථාපිත සමාගමක් වන සීමාසහිත සෑම් සමරසේකර සහ සමාගම, ගුනපාල සමරසේකර සහ ධම්මිකා ජයමහ සමරසේකර යන අයවළුන් විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් මිලියන එකයි දෙලක්ෂ අසූහය දහස් හාරසිය හැට එකයි ශත හැත්තෑපහක් (රු. 1,286,461.75) සහ රුපියල් මිලියන දෙකක (රු. 2,000,000) මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2004.03.29 දින සිට වර්ෂයකට 17% බැගින් රුපියල් මිලියන එකයි දෙලක්ෂ අසූහය දහස් හාරසිය හැට එකයි ශත හැත්තෑපහක (රු. 1,286,461.75) මුදලක් සහ 2004.08.01 දින සිට වර්ෂයකට 15.25% බැගින් රුපියල් මිලියන දෙක (රු. 2,000,000) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් මිලියන එකයි දෙලක්ෂ අසූ හයදහස් හාරසිය හැට එකයි ශත හැත්තෑපහක් (රු. 1,286,461.75) සහ රුපියල් මිලියන දෙකක (රු. 2,000,000) මුදලක් අයකර ගැනීම සඳහා මහනුවර බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 4041 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපල පිළිබඳ විස්තරය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර නගර සීමාව තුළ මාපනාවතුරේ පිහිටි කඩුපුල්ලේ කුඹුර (මැද කොටස) නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඩබ්ලිව් . ඒ. පියදාස විසින් මැන සාදන ලද 2003.05.17 දිනැති අංක 186/1/2003 දරන පිඹුරේ කැබලි අංක 4 වශයෙන් සළකුණු කර ඇති බෙදා වෙන් කළ හා නිරූපිත වපසරිය පර්චස් තිස්හතයි දශම අටයි අටක් වූ (අක්කර 0, රූ. 0, පර්. 37.88) (හෙක්.0.0959) ඉඩම් කැබැල්ලට එකී පිඹුරේ ප්‍රකාර මායිම් උතුරට : එකී පිඹුරේ කැබලි අංක 1 ද, උතුරු-නැගෙනහිරට : ශ්‍රීමත් කුඩාරත්වත්ත මාවතද, දකුණට : ශ්‍රීමත් කුඩාරත්වත්ත මාවත ද, සහ බටහිරට : එකී පිඹුරේ කැබලි අංක 3 ද සමග ඒ මත පිහිටි ගොඩනැගිලි ගහකොළ පළතුරු ආදී සෑම සියළු දේත් වේ.

එකී ඉඩම පහත සඳහන් ඉඩමේ අත්‍යවශ්‍ය අංශයක් නිර්මාණය කරයි. ඒ කෙසේ ද යත් -

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර නගර සීමාව තුළ මාපනා වතුරේ පිහිටි කටුපුල්ලේ කුඹුරේ මැද කොටස නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ජී. හේරත් විසින් මැන සාදන ලද 1967.09.12 දිනැති අංක 1803 දරන පිඹුරේ පෙන්නුම් කෙරෙන බෙදා වෙන් කළ හා නිරූපිත, වපසරිය රූඩ් එකයි පර්චස් නවයයි දශම දෙකක් වූ (අක්. 0, රූ. 1, පර්චස් 9.2) ඉඩම් කැබැල්ලට එකී පිඹුරේ ප්‍රකාර මායිම් උතුරට, උතුරු-නැගෙනහිරට සහ දකුණට : ශ්‍රීමත් කුඩාරත්වත්ත මාවතෙන් ද, දකුණු-බටහිරට : ඒ. සී. එල්. රත්වත්තේට අයිති වට්ටාරන්තැන්න වත්තෙන් ද, බටහිරට : ජේම්ස් බාස්ට අයිති වරිපනම්

අංක 50 දරන එම කුඹුරේම ඉතිරි කොටස ද, ශ්‍රීමත් කුඩාරත්වත්ත මාවත ද(මින්පෙර ලේඩි මැකලම් ඩ්‍රයිව්) සහ ඒමත පිහිටි ගොඩනැගිලි ගහකොළ පළතුරු ආදී සෑම සියළුදේත් වන අතර, මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 327/197 යටතේ ලියාපදිංචි කර ඇත.

02. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ගඟවට කෝරලේ දැනට මහනුවර නගරසභා සීමාව තුළ මාපනාවතුරේ පිහිටි මාරබැද්දේ කුඹුර නමැති ඉඩමෙන් එකී මිනින්දෝරු මහතා විසින් මැන සාදන ලද 2003.05.17 දිනැති අංක 186/1/2003 දරන පිඹුරේ කැබලි අංක 3 වශයෙන් ලකුණු කර පෙන්නුම් කෙරෙන, බෙදා වෙන් කළ හා නිරූපිත වපසරිය පර්චස් දහඅටයි දශම හතයි නවයයි බින්දුවක් වූ (අක්කර 0, රූඩ් 0, පර්.18.790) වූ ඉඩම් කැබැල්ලට එකී පිඹුරේ ප්‍රකාර මායිම් උතුරට : එකී පිඹුරේ කැබලි අංක 2 ද, නැගෙනහිරට : එකී පිඹුරේ කැබලි අංක 4 ද, දකුණට : කැබලි අංක 1-ටී එස්පී. 01/25/13-1 ඩබ්ලිව්. සහ බටහිරට : කැබලි අංක 60, ටී. එස්. පී. 01/25/13-01 ඩබ්ලිව් සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සෑම සියළුදේත් වන අතර, මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 354/158 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම පහත සඳහන් ඉඩමේ අත්‍යාවශ්‍ය අංගයක් නිර්මාණය කරයි. ඒ කෙසේ ද යත් - මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ගඟවට කෝරලේ දැනට මාපනාවතුර පල්ලේගම මහනුවර නගර සීමාව තුළ පිහිටි මාරබැද්දේ කුඹුර නැමති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එල් ඒ. ඩී. සී. විජේතුංග විසින් මැන සාදන ලද 1972.07.16 දිනැති අංක 6599 දරන පිඹුරේ කැබලි අංක 61 ලකුණු කළ බෙදාවෙන් කළ හා නිරූපිත වපසරිය පර්චස් විසිනවයයි දශම අටයි බින්දුවක් වූ (අක්කර 0, රූ. 0, පර්චස් 29.80) ඉඩම් කැබැල්ලට මායිම් උතුරට : ඇල සහ ප්‍රධාන පාරද, නැගෙනහිරට : එස්. සමරසේකරය අයිති කැබලි අංක 2, දකුණට : ලේඩි මැකලම් මාවතද, බටහිරට: එකී අංක 6599 දරන පිඹුරේ කැබලි අංක 60 ද, සමග ඒමත පිහිටි ගොනැගිලි ගහකොළ පළතුරු ආදී සෑම සියළු දේත් වන අතර මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඒ222/70 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරි වෙනුවට.
(මධ්‍යම කලාපය)

මහජන බැංකුව,
මධ්‍යම කලාප කාර්යාලය,
අංක 17, දළදා වීදිය,
මහනුවර.

05-32

මහජන බැංකුව සඳහා මහනුවර නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. කේ. විජේරත්න විසින් සහතික කරන ලද 2001.03.20 දින දරන අංක 3068 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම කොළඹ මහබටබැදිගේ රාලලාගේ මේරියන් බැසිලිනා මල්කාන්ති පෙරේරා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද එකී අංක 3068 දරන උකස්කරය යටතේ දැනට රුපියල් තුන්ලක්ෂ තිස්හතර දහස් නවසිය හතලිහකුත් ශත දහතුන (රු. 3,34,940.13) මුදලක් මහජන බැංකුවට ලැබිය යුතු හා අයවිය යුතු බැවින් ද 2002.02.07 දින සිට වෙන්දේසි දිනය තෙක් වර්ෂයකට සියයට විසිහය බැගින් (26%) රුපියල් තුන්ලක්ෂ තිස්හතර දහස් නවසිය හතලිහකුත් ශත දහතුන (රු. 3,34,940.13) මුදල සඳහා තවදුරටත් පොලිය හා ඊට අදාල අනෙකුත් ගාස්තු සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් තුන්ලක්ෂ තිස් හතරදහස් නමසිය හතලිහකුත් ශත දහතුන (රු. 3,34,940.13) මුදල ආපසු අයකර ගැනීම සඳහා මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් විසින් ඉහත කී අංක 3068 උකස්කරය යටතේ පූර්වෝක්ත බැංකුවට උකස් කරන ලද දේපල හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරයි.

## දේපල විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරුකෝරලේ රාගම්පත්තුවේ ජාඇල ප්‍රාදේශීය සභාවේ කඳාන උප කාර්යාලයේ නාගොඩ පිහිටි කෝංගහ වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් මැන සාදන ලද අංක 12181 හා 1982.10.15 දින දරන මිනුම් පිඹුරේ කැබලි අංක 1 වශයෙන් ලකුණු කර පෙන්නුම් කරන බෙදා වෙන් කල හා නිරූපිත වපසරිය පර්චස් දහහතරයි දශම එකයි අටක් (අක්.0, රූ.0, පර්.14.18) වූ කැබැල්ලට මායිම් උතුරට : කැබලි අංක 4 (අඩි 4ක් පළල පාරට වෙන් කල කොටස) නැගෙනහිරට : කැබලි අංක 2 ද, දකුණට : විල්බට් විජේසුන්දර මුදියන්සේගේ ඉඩම ද, බටහිරට : ලයනල් ප්‍රනාන්දුගේ ඉඩම ද යන මායිම් තුළ භූමිය සමග ඒ මත පිහිටි ගොඩනැගිලි ගහකොළ පලතුරු ආදී සෑම සියළු දේත් වන අතර, ගම්පහ ඉඩම් පදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරු/බී/461/191 හි ලියාපදිංචි කර ඇත. එකී අංක 12881 දරන පිඹුරේ පෙන්නුම් කරන කැබලි අංක 4 මතින් ඇති පාරේ (අඩි 4ක් පළල පාර) මාර්ග අයිතිය සමග

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරි (ම.ක.)

මහජන බැංකුව,
කලාප කාර්යාලය,
අංක 17, දළදා වීදිය,
මහනුවර.

05-29

---

## මහජන බැංකුව-කටුගස්තොට ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ මහජන බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.01.07 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

---

## ලංකා බැංකුව-වාද්දුව ශාඛාව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2005.10.13 වැනි දින පත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. මහජන නොතාරිස් ඩබ්. ඒ. එස්. සී. මැතිව් විසින් සහතික කරන ලද 1997.03.07 දිනැති අංක 1837 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2005.08.31 දින තෙක් පොළිය වශයෙන් රුපියල් විසිඑක්ලක්ෂ පන්දහස් හත්සිය විසිහතරයි ශත දෙකක් (රු. 21,05,724.02) සහ රුපියල් විසිඑක් ලක්ෂ පනස් හතර දහස් හත්සිය අනූහතරයි ශත හැට එකක (රු. 21,54,794.61) මුදලක් සමඟ රුපියල් හයලක්ෂ අසූඅට දහස් තුන්සිය තිහක (රු. 6,88,330) සහ රුපියල් හත්ලක්ෂ හතළිස් නව දහස් තුන්සිය හතළිස් අටයි ශත අසූහතරක (රු. 7,49,348.84) මුදලක් මත පිළිවෙළින් වසරකට සියයට පහළොව (15%) සහ සියයට පහළොවයි දශම පහ (15.5%) බැගින් පොළියක්, 2005.09.01 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් වාද්දුව, කැකුණගහතුඩුව, අංක 14ඒහි පදිංචි මහබදුගේ මංජුල පංචප්‍රසාද් ප්‍රනාන්දු මහතාගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 1837 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් විසිඑක්ලක්ෂ පන්දහස් හත්සිය විසිහතරයි ශත දෙකක් (රු. 21,05,724.02) සහ රුපියල් විසිඑක් ලක්ෂ පනස් හතර දහස් හත්සිය අනූහතරයි ශත හැට එකක (රු. 21,54,794.61) මුදල සමඟ 2005.09.01 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද, අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 03, ධර්මපාල මාවත, අංක 55ඒ හි පදිංචි වෙන්දේසිකාර ෂෞක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

## උපලේඛනය

බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ වාද්දු වස්කඩු දෙබැද්දෙහි කලුතර ප්‍රාදේශීය සභා සීමාවේ මැලේගම හි පිහිටි මහවත්ත *හෙවත්* කැකුණගහතුඩුව හි ලොට් 14 නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එල්. ඩබ්. එල්. ද සිල්වා විසින් සාදන ලද 1992 ජූනි 18 දිනැති අංක 9721 දරන පිඹුරේ විස්තර කළ ලොට් 14ඒ වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : ලොට් 23, අංක 375 දරන පිඹුරේ වෙන්කළ අඩි 15ක් පළල පාර සහ අංක 375 දරන පිඹුරේ ලොට් 26 (අඩි 10ක් පළල පාර) ද, නැගෙනහිරට : ලොට් අංක 375 දරන පිඹුරේ ලොට් 23 (අඩි 15ක් පළල පාර) ද, දකුණට : අංක 3044 දරන පිඹුරේ ලොට් 1හි ඉතිරි කොටස ද, බස්නාහිරට : අංක 375 දරන පිඹුරේ ලොට් 13 ද මායිම්ව එකී අංක 9721 දරන පිඹුර අනුව පර්චස් දහයක (අ. 0, රූ. 0, පර්. 10) ප්‍රමාණයකින් යුක්ත වේ. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 113/17හි ලියාපදිංචි කර ඇත.

තවද, පාර මත අයිතිය ද වේ.

එකී මැලේගම හි පිහිටි මහවත්ත *හෙවත්* කැකුණගහතුඩුව නමැති ඉඩම සහ 1988 ඔක්තෝබර් 06 සිට 1988 ඔක්තෝබර් මස 08 දක්වා දිනැති පිඹුරේ විස්තර කළ ලොට් ආර්3 වශයෙන් සඳහන් (අඩි 15ක් පළල පාර) බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : අඩි 15ක් පළල වෙන්කළ පාර ද, නැගෙනහිරට : අංක 375 දරන පිඹුරේ ලොට් 15 ද, දකුණට : අංක 3099 දරන පිඹුරේ ලොට් ආර් 2 ද, බස්නාහිරට : අංක 375 දරන පිඹුරේ ලොට් 14ඒ සහ 14සී ද, මායිම්ව එකී අංක 3099 දරන පිඹුර අනුව පර්චස් එකයි දශම අටයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 1.80) ප්‍රමාණයකින් යුක්ත වේ. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී90/263හි ලියාපදිංචි කර ඇත.

එකී මැලේගම හි පිහිටියාවූ ද, මහවත්ත *හෙවත්* කැකුණගහතුඩුව නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු සිරි බෝපේආරච්චි විසින් සාදන ලද 1988 මාර්තු 11 දිනැති අංක 375 දරන පිඹුරේ විස්තර කළ ලොට් 23( අඩි 15ක් පළළ) වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : පාර ද, නැගෙනහිරට : ලොට් 15-22 ද, දකුණට : ලොට් 14 ද, බස්නාහිරට : ලොට් 14, 26, 11, 10, 25, 7, 6, 24, 3 සහ 2 ද, මායිම්ව එකී අංක 375 දරන පිඹුර අනුව පර්චස් විසිඑකයි දශම නවයයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 21.90) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 90/247හි ලියාපදිංචි කර ඇත.

ඩබ්. එන්. පී. සුරවිමල,
කළමනාකරු.

ලංකා බැංකුව,
වාද්දුව ශාඛාව.

05-50

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

සංශෝධිත ගාස්තු
1995 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ.)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළකරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. කාර්යාල වේලාවන් පෙරවරු 9.00 සිට පස්වරු 4.45 දක්වා වේ.

4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.30 සිට පස්වරු 3.30 දක්වා බව සැලකිය යුතුයි.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති තැනට එවිය යුතුය.

6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපතඩ් කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ටයිප් ගසා එවිය යුතුයි. අත් අකුරින් යුතු කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතෙකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1995 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේයි :-

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | 51 | 0 |
| වැඩිවන සෑම අඟලකටම හෝ ඉන් කොටසකටම | 51 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | 504 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | 1,008 | 0 |

(අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)

11. සෑම සිකුරාදා දිනයකම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයඩ් පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. සෑම මාසයකම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 1995.01.01 දින සිට සංශෝධිත දායක ගාස්තුව* :-

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික)

| | මෙරට රු. | ශ. | පිටරට රු. | ශ. |
|---|---|---|---|---|
| I වන කොටස සම්පූර්ණයෙන් (I, II, III ඡේද තුනම ඇතුළත්) | 1,612 | 0 | 2,098 | 0 |
| II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 572 | 0 | 745 | 0 |
| I වන ඡේදය | 520 | 0 | 1,007 | 0 |
| II වන ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර්, විභාග ආදිය) | 624 | 0 | 1,009 | 0 |
| III වන ඡේදය | 468 | 0 | 907 | 0 |
| අති විශේෂ ගැසට් පත්‍රය | 3,360 | 0 | 4,422 | 0 |

ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ 12 මාසයකට නොඅඩු කාලසීමාවකට පමණය.

*තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | | මිළ රු. | ශ. | තැපැල් ගාස්තුව (මෙරට) රු. | ශ. |
|---|---|---|---|---|---|
| (අ) | I වන කොටස | 31 | 0 | 5 | 0 |
| | II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 11 | 0 | 5 | 0 |
| (ආ) | I වන ඡේදය | 10 | 0 | 5 | 0 |
| | II වන ඡේදය | 12 | 0 | 5 | 0 |
| | III වන ඡේදය | 9 | 0 | 5 | 0 |

* දායක මුදල් භාරගැනීම සහ තනිපිටපත් විකිණීම භාර ඩිකොළඹ 01 ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වු විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියළු දෙනාගේම පහසුවටද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ 01, ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

*සැළකිය යුතුයි.*- මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළකිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | 2005 | | | |
| මැයි | 2006.05.05 | සිකුරාදා | 2006.04.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.05.11 | බ්‍රහස්පතින්දා | 2006.04.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.05.19 | සිකුරාදා | 2006.05.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.05.26 | සිකුරාදා | 2006.05.11 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| ජුනි | 2006.06.02 | සිකුරාදා | 2006.05.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.06.09 | සිකුරාදා | 2006.05.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.06.16 | සිකුරාදා | 2006.06.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.06.23 | සිකුරාදා | 2006.06.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.06.30 | සිකුරාදා | 2006.06.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූලි | 2006.07.07 | සිකුරාදා | 2006.06.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.07.14 | සිකුරාදා | 2006.06.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.07.21 | සිකුරාදා | 2006.07.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2006.07.28 | සිකුරාදා | 2006.07.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.